# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

දුරකථනය / Telephone: +94 11 2758230, +94 112758220
ෆැක්ස් / Fax: +94 11 2801604
මගේ අංකය / My Number: SE/08
ඔබේ අංකය / Your Number:

නුගේගොඩ,
ශ්‍රී ලංකාව.
NUGEGODA
SRI LANKA.
තැපැල් පෙට්ටිය - 6 - නුගේගොඩ.
POST OFFICE BOX - 6 - NUGEGODA.

Email : drasp@sjp.ac.lk
Web: www.sjp.ac.lk


2023.09.14

පෙරහැර අංකය:

ගරු ස්වාමීන්වහන්ස
ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි

**<u>49 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2023</u> – (2023 ඔක්තෝබර් මස 06, 07, සහ 08)**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 49 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2023 ඔක්තෝබර් මස 06, 07 සහ 08 යන දිනවල කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වනු ලැබේ.**

මෙම උපාධි ප්‍රදානෝත්සවය සැසි 09 කින් යුක්ත වන අතර ඔබට නියමිත සැසිය පහත දැක්වේ.

නවවන සැසිය - **2023 ඔක්තෝබර් මස 08 වැනි දින ප.ව.02.30 සිට ප.ව.04.30 දක්වා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ දර්ශනසූරි, දර්ශනපති, දර්ශනපති ව්‍යාපාර ආර්ථික විද්‍යාව, ශාස්ත්‍රපති, ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති, කළමනාකරණ විද්‍යාපති, කාර්මික විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති, දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාපති, පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති, බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති, භූගෝලීය විද්‍යා තොරතුරු පද්ධති හා දූරස්ථ සංවේදය පිළිබඳ විද්‍යාපති, මත්ස්‍ය හා ජලජීවී සම්පත් කළමනාකරණ පිළිබඳ විද්‍යාපති, රාජ්‍ය ප්‍රතිපත්ති සහ කළමනාකරණ විද්‍යාපති, වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණ පිළිබඳ විද්‍යාපති, ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති, ව්‍යවහාරික මූල්‍ය විද්‍යාපති, ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යාපති, ව්‍යාපාර පරිපාලන විද්‍යාපති, රාජ්‍ය කළමනාකරණපති, ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යා පශ්චාද් උපාධිය, ව්‍යවසායකත්වපති, වෘත්තීය ගිණුම්කරණ පශ්චාද් උපාධිය, ව්‍යාපාර ආර්ථික විද්‍යාපති, සමාජ විද්‍යා පශ්චාද් උපාධි, අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, අලෙවි කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, කාර්මික විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, දේපල කලමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, භූගෝලීය විද්‍යා තොරතුරු පද්ධති හා දූරස්ථ සංවේදය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, මත්ස්‍ය හා ජලජීවී සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය,ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, ව්‍යවසායකත්වය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය,කාර්මික ගණිතය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය,වන විද්‍යාව හා පාරිසරික කළමණාකරණය පිළිබඳ උපාධි අභිඥාන පත්‍රය, පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි සහතික පත්‍රය,ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි සහතික පත්‍රයට අදාල සියලුම උපාධිලාභීන් සඳහා**

**සැ.යු.:- ඔබ වෙත පිරිනමනු ලබන උපාධි සහතිකයට, උප්පැන්න සහතිකයට අනුව ඔබගේ නම ඉංග්‍රීසියෙන් සහ සිංහලෙන් ඇතුලත් කරනු ලබන්නේ විශ්වවිද්‍යාලයීය ලියාපදිංචි ලේඛනයන්හි හා විශ්වවිද්‍යාලයීය පාලක සභාවෙන් අනුමත අවසන් ප්‍රතිඵල ලේඛනයන්හි සඳහන් ආකාරයට බැවින් කිසිදු ආකාරයක වෙනසක් සිදු නොකරන බව අවධාරණයෙන් යුතුව දන්වා සිටිමි.**

1. **<u>උපාධිලෝගු සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:</u>**

**2023 සැප්තැම්බර් 23 (සෙනසුරාදා) සහ සැප්තැම්බර් 24 (ඉරිදා) යන දිනයන්හි පෙරවරු 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා සහ පස්වරු 1.00 සිට පස්වරු 4.00 දක්වා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේදී උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම, සාටකය සහ ප්‍රවේශ පත්‍ර ඔබ වෙත නිකුත් කරනු ලැබේ.**

- **උපාධි ලෝගුව, සාටකය සහ හිස්වැස්ම සමඟ උපාධි ප්‍රදානෝත්සවයට අදාළ ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම සඳහා රු.5,000/= තැන්පතු මුදල ගෙවන ලද අදාළ කුවිතාන්සිය (බැංකු රිසිට්පත/මාර්ගගත ගෙවුම් ලදුපත), ශිෂ්‍ය වාර්තා පොත සහ මෙම ලිපිය පීඨ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. <u>ශිෂ්‍ය හැඳුනුම්පත මෙතෙක් බාරදී නොමැති නම් එය මෙම අවස්ථාවේ දී පීඨ කාර්යාලයට බාර දිය යුතුය</u>.**

අදාළ ගෙවීම සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ ශිෂ්‍ය ගෙවීම් පද්ධතිය වෙත පිවිස එහි ඇති ඔබට අදාළ ගිණුම් අංකය සහිත ආදර්ශ රිසිට් පත බාගත කරගෙන ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදලින් ගෙවීම් කළ හැකිය. ඊට අමතරව ක්‍රෙඩිට් කාඩ්පත භාවිතයෙන් අන්තර්ජාලය හරහා ද ගෙවීම් කළ හැකිය. එසේ ගෙවීම් කර බාගත කර ගන්නා ලද මුදල් ගෙවීම් කුවිතාන්සිය 2023 සැප්තැම්බර් මස 20 දිනට පෙර සූදානම් කරගත යුතුය. ඔබට උපාධිලෝගු ලබා ගැනීමේ දී ඇතිවන අපහසුතා මඟ හරවා ගැනීම සඳහා ඉහත දිනට පෙර ගෙවීම් කරන්න.

පහත සඳහන් ආකාරයට විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස ගෙවීම් කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගත හැක.

www.sjp.ac.lk ➡ Students ➡ Student Payments ➡ Internal Student ➡ Enter Your NIC Number & Select Faculty ➡ Select **'Refundable Cloak Fee'**

තවද විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ පළකර ඇති පහත සඳහන් අයදුම්පත් දෙක (02) සම්පූර්ණ කර <u>උපාධි ලෝගු ලබා ගන්නා අවස්ථාවේ දී පීඨ කාර්යාලය වෙත අනිවාර්යෙන්ම බාර දිය යුතු වේ.</u>

1. උපාධි ලෝගු ගාස්තු නැවත ගෙවීමේ අයදුම්පත (ඇමුණුම i)
2. උපාධිලාභීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ ප්‍රශ්නාවලිය (ඇමුණුම ii)

එලෙසම උපාධි ලෝගුව, හිස්වැස්ම සහ සාටකය භාවිතා කිරීම සඳහා වන ආචාරධර්ම උපාධිලාභියා විසින් අනිවාර්යෙන්ම පිළිපැදිය යුතු වන අතර එම ආචාරධර්ම විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. එය කියවා හොඳින් තේරුම් ගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.
තවද කිසිදු හේතුවක් නිසා උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලබන දින තුළ උපාධි ලෝගු හා හිස්වැසුම් නිකුත් කරනු නොලැබේ. උපාධි ලෝගුව, හිස්වැස්ම නොමැතිව කිසිදු ගිහි උපාධිලාභියකුට උපාධි පෙරහැරට සහභාගී විය නොහැකිය. උපාධිලාභී භික්ෂූන් වහන්සේලා සඳහා විජිනිපත් එදින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ලබා ගත හැකිය.

2. **<u>උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය ආපසු බාරදීම:</u>**

උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය ඔබගේ උපාධි ප්‍රදානෝත්සවය අවසානයේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටවනු ලබන විශේෂ කවුන්ටරය වෙත භාර දිය යුතුය. යම් හෙයකින් එලෙස බාරදිය නොහැකි වුවහොත් පහත සඳහන් දිනයන්හි දී පමණක් අදාළ පීඨ කාර්යාලයට පැමිණ උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය භාර දිය හැකි අතර නියමිත දිනට පෙර උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය බාරදීමට අපොහොසත් වුවහොත් ප්‍රමාද වන දින අනුව දඩ මුදලක් ගෙවීමට සිදුවනු ඇත.

**2023 ඔක්තෝබර් මස 14 (සෙනසුරාදා)**
**2023 ඔක්තෝබර් මස 15 (ඉරිදා)**

උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය භාරදෙන අවස්ථාවේ දී උපාධි ලෝගුව සහ හිස්වැස්ම සඳහා ගෙවන ලද රු. 5000/= ක තැන්පත් මුදල ඔබ වෙත මුදලින් ගෙවීමට හෝ ඔබගේ ගිණුම් අංකයට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. මීට අමතරව ඔබ වෙත ලබා දුන් උපාධි ලෝගුව, හිස්වැස්ම සහ සාටකයට කිසියම් අලාභ හානියක් වී ඇත්නම් හෝ එය අස්ථානගත වී ඇත්නම් එහි සම්පූර්ණ වටිනාකම ඔබට ගෙවීමට සිදුවේ.

3. **<u>ඇඳුම:</u>**

කාන්තා උපාධිලාභීන් අභිමත වර්ණයක <u>සාරි හෝ ඔසරිවලින්</u> අනිවාර්යෙන්ම සැරසී සිටිය යුතු අතර පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමින් හෝ ටයි පටිය සහිත යුරෝපීය ඇඳුමින් සැරසී සිටිය යුතුය.

4. **<u>පැමිණීම:</u>**

උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ වීමට <u>පැය එක හමාරකට පෙර</u> බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට පැමිණ උපාධිලාභී පෙරහැර සඳහා සූදානම් විය යුතුය.